**පෙරදිග සංගීතය -7 ශ්‍රේණිය (සාමාන්‍ය පාඩම ) 3 වාරය - 7 පාඩම**

## දැල් ගී පිළිබඳ තොරතුරු

මුහුදේ දැල් ඇදීමේදී ධීවරයින් විසින් ගායනා කරන ගීත **දැල් ගී** නමින් හැඳින්වේ.ඔරුව මුහුදට තල්ලු කිරීමේ දී ද , දැල ගොඩට ඇදීමේදී ද මෙම ගීත ගායනා කරයි.දැලක් ඇදීමට බොහෝ පිරිසකගේ ශක්තිය අවශ්‍ය වන අතර එම ශක්තිය එකවර ලබා ගැනීමට දැල් ගී ගායනා කරනු ලබයි .පිරිසක් විසින් සාමූහිකව ගායනා කරන ගැමි ගී විශේෂයකි.බොහෝ ගීතවල අර්ථ විරහිත වචන යොදා ගනී.

**උදාහරණ-** ලේ ලකඩි ලේ ලෝ

ඒ ආලේ හෙලෙයිලෝ

ගීතවල වචන රිද්මයානුකූල වේ.දැල් ගී මෙහෙ ගී ගණයට අයත් වේ.මාත්‍රා 3 න් 3 කඩිනම් රිද්ම රටා බොහෝවිට යොදා ගනී.මෙම ගීත වල එක් පාදයක් නායකයා ගායනා කරන අතර අනෙක් පාදය සාමූහිකව ගයනු ලබයි.

**නායකයා - සන්තානම් පල්ලි යන්න**

**පිරිස - ලේ ලකඩි ලේ ලෝ**



දැල් ගීත

ඒ ආලේ හෙලෙයි ලෝ - මන්නඩිරාල හෙලෙයි ලෝ
පාරුව මුදට හෙලෙයිලෝ - තල්ලු කරා පන් හෙලෙයි ලෝ

ඒලා ඒලම්මා - ඒලෙයි ඒලම්මා
හෙල හෙල හේල හෙලෙයි - හේල හෙලෙයි හෙලෙයියා//

ලේ ලකඩි ලේ ලෝ//
ලොවෙ ලොවෙ ලෝවෙ ලමාලා
ලේ ලකඩි ලේලෝ//

සන්තානම් පල්ලි යන්න - ලේ ලකඩි ලේ ලෝ
ජේසුතුමන් වැඳලා එන්න - ලේ ලකඩි ලේ ලෝ
බරට බරයි බල පඳුරයි - ලේ ලකඩි ලේ ලෝ
දෙවි පිහිටෙන් ගොඩ අදින්න - ලේ ලකඩි ලේ ලෝ
මූල්ල දූව ගම වසනා - ලේ ලකඩි ලේ ලෝ
පිං හාමි ගේ දූව සොබනා - ලේ ලකඩි ලේ ලෝ
ගහලා කටු මොණරි වගේ - ලේ ලකඩි ලේ ලෝ
බැඳලා මාල ගිරවි වගේ - ලේ ලකඩි ලේ ලෝ

හෙල හෙල හේල හෙලෙයි - හේල හෙලෙයි හෙලෙයියා

අතට අරන් හෙලෙයියා - අත ගහපන් හෙලෙයියා
විග විගහට හෙලෙයියා - තවත් ටිකක් හෙලෙයියා
හෙල හෙල හේල හෙලෙයි - හේල හෙලෙයි හෙලෙයියා////

පැවරුම

තවත් දැල් ගී හා එහි සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණය කරන්න.